**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - 2020**

---

**1.1 මතය**

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ("බැංකුව") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියාකර ඇති බව,

- බැංකුව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශනය

### 1.5.1 නොසැසඳු පාලන ගිණුම් සහ වාර්තා

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2020 දෙසැම්බර් 31 දිනට ස්ලිප් පාලන ගිණුම (Slip Control account) තුළ රු.1,871,997 ක නොසැසඳු බැර වටිනාකමක් හෙළිදරව් කර තිබුණි. | ලේඛනගත සාක්ෂි නොමැතිකම හේතුවෙන් මෙම ශේෂය කපා හැරීමට නියමිතය. | නොසැසඳු ශේෂය සැසඳීමට හෝ කපා හැරීමට හෝ ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | 2020 දෙසැම්බර් 31 දිනට වෙනත් වත්කම් යටතේ හෙළිදරව් කරන ලද අවිනිශ්චිත ගිණුම් තුනක් තිබුණි.<br>විස්තර පහත පරිදි වේ. | 1/06/1102 – රු.4,309,124 මෙම ශේෂය 2020.12.31 දින අපගේ රැස් කිරීමේ ගිණුම් වෙත පාරිභෝගික තැන්පතු නියෝජනය කරන අතර, බැංකු ලෙජර් ගිණුම් යාවත්කාලීන කිරීම සඳහා තාවකාලික ගිණුම්වල සටහන් කර ඇත, විස්තරාත්මක බැංකු ප්‍රකාශය ලැබීමෙන් පසු මෙම ශේෂය 2021 ජනවාරි පළමු සතියේ නිරවුල් කරන ලදී.<br>1/06/1104 - රු.54,509 මෙම ශේෂය 2021 වර්ෂය තුළ නිරවුල් කර ඇත.<br>1/09/1618 – නිරවුල් කිරීමට ඇත. | වර්ෂ අවසානයේ බැංකුවේ ඇති සියලුම අවිනිශ්චත ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

| GL ගිණුම් | ශේෂය |
|---|---|
| 1/06/1102 | 4,309,124 |
| 1/06/1104 | 54,509 |
| 1/09/1618 | 15,783 |
| එකතුව | 4,379,416 |

**1.6 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුමේ 2/22/4703 සහ 2/22/4702 වෙත යොමු වන පරිදි පිළිවෙලින් රු.1,563,966 සහ රු.1,233,723 ලෙස දිගුකාලීන හිඟ අත්තිකාරම් ශේෂ දෙකක් පැවතුණි. | උපකාරක ලියකියවිලි නොමැතිකම හේතුවෙන් මෙම ශේෂයන් කපා හැරිය යුතුය. | දිගුකාලීන හිඟ අත්තිකාරම් ශේෂය හැකි ඉක්මනින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6.2 ණය අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය සඳහා දළ අක්‍රීය ණය අත්තිකාරම්, පිළිවෙලින් සේවක අර්ථසාධක ණය සහිතව සියයට 22.94ක ප්‍රතිශතයක් සහ, සේවක අර්ථසාධක ණය රහිතව සියයට 10.71ක ප්‍රතිශතයකි.මෙය පිළිවෙලින් සියයට 6.8ක් හා සියයට 4.9ක ප්‍රතිශතයක් වූ කර්මාන්ත අනුපාතය ඉක්මවා ගොස් තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට දළ අක්‍රීය ණය අනුපාතය සියයට 19.85 කි.<br><br>ශුද්ධ අක්‍රීය ණය - සියයට 16.55<br><br>සේවක අර්ථසාධක අරමුදල් රහිතව දළ අක්‍රීය ණය - සියයට 9.19 | බැංකුවේ අක්‍රිය ණය අනුපාතය අඩු කර ගැනීමට අයකරගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 03/2016. | බැංකුව විසින් 2020 වර්ෂය සඳහා රු.1,756,213 ක මුදලක් උපයනවිට ගෙවීම් බද්ද (PAYE) සේවකයන්ගේ වැටුපෙන් අඩු කරනු වෙනුවට එහි සේවකයන් වෙනුවෙන් තම අරමුදල්වලින් ගෙවා ඇත. | සාමූහික ගිවිසුමේ කොන්දේසි අනුව උපයනවිට ගෙවීම් බදු PAYE(APT) ගෙවනු ලැබේ. | බැංකුවේ උපයනවිට ගෙවීම් බදු (PAYE) ගෙවීම සඳහා "2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED 03/2016" අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.1.i.c වගන්තිය අනුව මණ්ඩලය විසින් ප්‍රධාන අවදානම් හඳුනාගෙන බැංකුව තුළ ඇති අවදානම් දූරදර්ශී ලෙස කළමනාකරණය කිරීම සඳහා සුදුසු පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කළ යුතුය. | බැංකුව 2020 වර්ෂය සඳහා BCPDR සිදු කර නොමැති අතර 2020 BIRMC රැස්වීම් වාර්තාවල ලියකියවිලි රැස්කිරීම් දුර්වලතාව නිරීක්ෂණය විය. | අනාගත අනුකූලතාව සඳහා සටහන් කර ඇත. | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.1.i.c වගන්තියේ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (iii) | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.1.i.e වගන්තිය අනුව මණ්ඩලය බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව සමාලෝචනය කළ යුතුය. | ඒඑස් 400 තොරතුරු සහ වාර්තා උත්පාදනය කිරීමේදී කර්මාන්ත අවශ්‍යතා සඳහා පහසුකම් සපයා නොතිබුණි. | නව මූලික බැංකු පද්ධතියක් මිලදී ගැනීමට බැංකුව කටයුතු යොදා ඇත. 2021 දෙසැම්බර් 16 දින ලංසු ඇරයුම් සඳහා ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීම සහ 2022 පෙබරවාරි 03 දිනෙන් ලංසු අවසන් වීම. | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.1.i.e වගන්තියේ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (iv) | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.1.i.l වගන්තිය අනුව මණ්ඩලය නියාමන පරිසරය අවබෝධ කර ගත යුතු අතර බැංකුව නියාමකයින් සමඟ ඵලදායී සබඳතාවක් පවත්වාගෙන යන බවට සහතික විය යුතුය. | අදාළ නියාමකයින් සමඟ වාර්තා කිරීමේ කාල සීමාවන් සාක්ෂාත් කර ගැනීමට බැංකුවට නොහැකි විය.<br>උදා:- 2019 සහ 2020 දී බැංකුවේ වාර්ෂික වාර්තා. | අනාගත අනුකූලතාව සඳහා සටහන් කර ඇත. | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.1.i.l වගන්තියේ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (v) | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.1.iii වගන්තිය අනුව මණ්ඩලය නිතිපතා රැස්විය යුතු අතර | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 2020 අප්‍රේල් මාසයේ සිට ආරම්භ කර ඇති අතර 2020 වර්ෂය සඳහා රැස්ව තිබුණේ 11 වතාවක් | 2020 ජනවාරි මාසයේදී නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබූ නමුත් යෝග්‍යතාවය සහ අධ්‍යක්ෂවරුන්ගේ | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.1.iii වගන්තියේ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවම වශයෙන් වසරකට දොළොස් වතාවක් දළ වශයෙන් මාසික කාල පරතරයකින් පැවැත්විය යුතුය. | පමණි. | හිමිකම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නිෂ්කාශනය ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 2020 අප්‍රේල් 20 දක්වා පැවැත්වීමට නොහැකි විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) අනුමැතිය ලැබීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා රැස්වී 2020 වර්ෂය තුළ රැස්වීම් 11ක් පැවැත්වීමට සමත් වී ඇත. | |
| (vi) | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.2.i වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7 ට නොඅඩු සහ 13 ට නොවැඩි විය යුතුය. | බැංකු පනතට අනුව, අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතක් (7) විය යුතුය. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ සැබෑ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පහක් (5) විය. | සටහන් කර ඇත, දැන් අනුකූලවේ. | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.2.i වගන්තියේ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (vii) | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.5.ix වගන්තිය අනුව සභාපතිවරයා විසින් ප්‍රධාන කළමනාකාරීත්වයේ හෝ වෙනත් විධායක රාජකාරිවල ඍජු අධීක්ෂණය සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරත නොවිය යුතුය. | ප්‍රධාන අභ්‍යන්තර විගණක(CIA), සහකාර කළමනාකරු (ණය) සහ සහකාර අභ්‍යන්තර විගණකවරයාගේ පත්වීම් ලිපි 2020 දී සභාපතිවරයා විසින් අත්සන් කර ඇති බව නිරීක්ෂණය විය. | සටහන් කර ඇත. අපි 2021 දෙසැම්බර් 31 දිනැති ලිපිය මගින් මේ සම්බන්ධයෙන් GAගෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා ඇත. | සභාපතිවරයා බැංකුවේ විධායක රාජකාරී ඉටු නොකළ යුතුය. |
| (viii) | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.6.iii.සී වගන්තිය | ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ | ඉදිරි ක්‍රියාමාර්ග සඳහා සටහන් කර ඇත. අනාගතයේදී එකඟ වූ KPIවලට එරෙහිව | 2007 අංක 12 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ 3.6.iiසී වගන්තියේ |

| | | | |
|---|---|---|---|
| අනුව මානව සම්පත් හා වේතන කමිටුව විසින් නියමිත අරමුණු සහ ඉලක්කවලට එරෙහිව ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ කාර්ය සාධනය (KMP) වරින් වර ඇගයීමට ලක් කළ යුතුය. | කාර්ය සාධනය KMPවල කාර්ය සාධන ඇගයීම සඳහා බැංකුව ආරම්භයේ දී තබා ඇති අරමුණු සහ ඉලක්ක සලකා බලා නොමැති බව නිරීක්ෂණය විය. | KMPවල කාර්ය සාධනය නිරීක්ෂණය කිරීමෙන් ඔවුන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. | රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.355,834,458 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.419,073,544 ක් විය. එබැවින් මෙහෙයුම් ප්‍රතිඵලයේ රු.63,239,086 ක අඩුවීමක් දක්නට ලැබුණි. මෙම අඩු වීමට හේතු වී ඇත්තේ ඉකුත් වසරට සාපේක්ෂව 2020 වර්ෂයේ ආදායම් බදු වියදම් සහ අපහායන ගාස්තු වැඩිවීමයි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් ප්‍රවනතා විග්‍රහය**

------------------------------------------

බැංකුවේ පොලී ආදායම රු.මිලියන 95.2කින් හෙවත් සියයට 1.6කින් පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ ගොස් තිබුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ පෙර වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 1.2කින් හෙවත් සියයට 3.6කින් ණය සහ අත්තිකාරම් වැඩිවීමයි. පොලී වියදම ද රු. මිලියන 9.1 කින් හෝ සියයට 0.23 කින් ඉහළ ගොස් ඇති අතර එය පෙර වර්ෂය හා සසඳන විට වෙළෙඳපොළේ පොලී අනුපාත අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය. ණය නිෂ්පාදන අනුව පෙර වර්ෂයට සාපේක්ෂව බැංකුව විසින් සිදු කරන ලද අපහායන ගණනය කිරීම හේතුවෙන් අපහායන ගාස්තු රු.මිලියන 138.7 කින් වැඩි වී තිබුණි.

**2.3 ගිණුම්කරණ අනුපාත විග්‍රහය**

------------------------------

බලපත්‍රලාභී විශේෂිත බැංකු අනශිත අනුපාත සහ පසුගිය වර්ෂ හතරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| **විස්තරය** | **අනශිත අනුපාත** | **බැංකුව** | | | |
|---|---|---|---|---|---|
| **වර්ෂය** | **2020** | **2020** | **2019** | **201** | **2017** |
| <u>**ලාභදායී අනුපාත**</u> | | | | | |
| ස්කන්ධය මත ප්‍රතිලාභය (ROE) (ප්‍රතිශතය) | 10.59 | 6.09 | 7.73 | 4.8 | 3.62 |
| වත්කම් සාමාන්‍ය මත ප්‍රතිලාභය (ROA) (ප්‍රතිශතය) | 0.94 | 1.15 | 1.11 | 1.1 | 0.98 |
| ශුද්ධ පොලී ආන්තිකය (ප්‍රතිශතය) | 3.2 | 4.24 | 4.52 | 4.7 | 4.66 |
| <u>**ප්‍රග්ධන ප්‍රමාණාත්මක අනුපාත**</u> | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රග්ධන අනුපාත - පෙළ 1 | 12.05 | 21.58 | 21.04 | 21. | 23.74 |
| මුළු ප්‍රග්ධන අනුපාත | 15.36 | 22.67 | 21.77 | 22. | 24.29 |
| **<u>වත්කම්වල ගුණාත්මකභාවය</u>** | | | | | |
| දළ අත්තිකාරම් අක්‍රීය ණය අනුපාතය (සේවක අර්ථසාධක අරමුදල් ණය ඇතුලත්ව) | 6.8 | 22.94 | 21.21 | 22 | 19.37 |
| දළ අත්තිකාරම් අක්‍රීය ණය අනුපාතය (සේවක අර්ථසාධක අරමුදල් ණය රහිතව) | 4.9 | 10.71 | 7.73 | 7.0 | 4.5 |
| **<u>ද්‍රවශීලතා අනුපාත</u>** | | | | | |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය (ප්‍රතිශතය) | 59.52 | 116 | 121.05 | 83. | 86.88 |

i 2020 වර්ෂයේ ලාභය පෙර වර්ෂයට වඩා අඩුවීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට ස්කන්ධය මත ප්‍රතිලාභය (ROE) සියයට 1.64 ක ප්‍රතිශතයකින් වැඩිවීමක් නිරීක්ෂණය විය.

ii 2020 වර්ෂයේ ශුද්ධ පොලී ආන්තිකය සියයට 4.24 ක ප්‍රතිශතයක් වූ අතර එය ආංශික බලපත්‍රලාභී විශේෂිත බැංකු ක්ෂේත්‍රයේ ප්‍රතිශතයක් වන සියයට 3.2 ට සාපේක්ෂව වැඩි වීමකි.

iii බලපත්‍රලාභී බැංකු ක්ෂේත්‍රයේ සේවක අර්ථසාධක අරමුදල් සහිතව දළ අත්තිකාරම් අක්‍රීය ණය අනුපාතිකය සියයට 6.8 ක ප්‍රතිශතයක් වන අතර බැංකුවේ අක්‍රීය ණය අනුපාතිකයක් ඉතා ඉහළ අගයක් ගනී. එයට හේතුව වන්නේ සේවක අර්ථසාධක අරමුදල් ණය වර්ගය තුළ අක්‍රීය ණය ඉහළ අගයක් ගැනීම වේ. කෙසේ වෙතත් සේවක අර්ථසාධක අරමුදල් ණය ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් අයකර ගත හැකිය. බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් රහිතව දළ අත්තිකාරම් අක්‍රීය ණය අනුපාතිකය 2020 වර්ෂයේදී සියයට 10.71 ක ප්‍රතිශතයක් වන අතර එය ක්ෂේත්‍රයේ අනුපාතිකයට වඩා සියයට 4.9 ක ප්‍රතිශතයකින් වැඩිය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 හඳුනාගත් අලාභ

-----------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| 2016 සැප්තැම්බර් 01 සිට 2017 මාර්තු 31 දක්වා කාලය තුළ බැංකුවේ ණය අංශය මගින් ව්‍යාජ පෞද්ගලික ආයතන දෙකක සේවකයින් ලෙස පෙනී සිටි අයදුම්කරුවන් හතළිස් හත් දෙනෙකු (47) සඳහා රුපියල් මිලියන 66.34 ක ණය මුදලක් ලබා දී තිබුණි. ව්‍යාජ ආයතන දෙකේ සේවකයින් ලෙස පෙනී සිටින අයදුම්කරුවන් අදාළ ණය සඳහා අයදුම් කිරීමේදී ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බව අනාවරණය විය. ඉහත ණය මුදලින් රු.61,506,617 ක් 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂ ගෙවීම ලෙස සටහන් කර තිබුණි. | අදාළ සැකකරුවන්ට එරෙහිව අපරාධ විමර්ශන කොට්ඨාශයේ නඩු පවරා ඇති අතර එම ණය ලබාදීමට සම්බන්ධ අදාළ සේවකයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන ඇත. | එම මුදල අයකර ගැනීමට වැරදිකරුවන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වගකිවයුතු සේවකයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | යූආර් ගිණුමේ රු.38,378,330 ක තාවකාලික පියවූ තත්ත්වය මේ දක්වා විසඳා නොතිබුණි. | 2021 වර්ෂය තුළ මෙම ශේෂයන් නිරවුල් කර ඇත. | බැංකුවේ මෙහෙයුම් සුමටව කිරීම සඳහා ණය පරිපාලනය විසින් මෙවැනි ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| (ii) | 2020 දෙසැම්බර් 31 දිනට රු.72,103,281 ක දිගුකාලීන පාරිභෝගික ආපසු ගෙවීමේ ශේෂයන් නිරීක්ෂණය විය. | 2021 දෙසැම්බර් 31 දිනට මෙම ගිණුමේ ශේෂය රු.50,739,909 ක් දක්වා අඩු වී ඇත. | දිගුකාලීන පාරිභෝගික මුදල් ආපසු ගෙවීමේ ශේෂයන් හැකි ඉක්මනින් පියවිය යුතුය. |
| (iii) | ලබා දී ඇති සහන කාලය යටතේ ණය සහ අත්තිකාරම්වල යාවත්කාලීන කළ කල්පිරීමේ දිනයන් පද්ධතිය තුළ නොතිබුණි. | වත්මන් ක්‍රමය සැලසුම් කර ඇත්තේ වාරික ගණන මත පදනම්ව ණය අයකර ගැනීමට මිස කල් පිරෙන දිනය මත නොවේ. අත්හිටුවීමේ කාලසීමාව සමඟ කල් ඉකුත් වූ දිනය ගණනය කිරීමට බැංකුව පද්ධතිය වෙනස් කරනු ඇත. | ණය සහ අත්තිකාරම්වල යාවත්කාලීන කළ කල්පිරීමේ දිනයන් පද්ධතිය තුළ තිබිය යුතුය. |
| (iv) | 2020 දෙසැම්බර් 31 දිනට ණය කළඹෙහි PL සහ NPL වර්ගීකරණය නිසි ලෙස හඳුනාගෙන නොතිබුණි. | PL සහ NPL වර්ගීකරණය පාරිභෝගිකයාගේ හිඟ තත්ත්වය මත පදනම් වේ. | ණය කළඹෙහි PL සහ NPL වර්ගීකරණය නිවැරදි විය යුතු අතර එය මූල්‍ය අංශය මගින් පරීක්ෂා කළ යුතුය. |
| (v) | තොරතුරු තාක්ෂණ අංශයේ හෝ බැංකුවේ මුදල් අංශයේ තොරතුරු තාක්ෂණ දත්ත නිස්සාරණයේ දත්ත වලංගු කිරීමේ පාලන කොටසක් නොමැති බව නිරීක්ෂණය විය. | තොරතුරු තාක්ෂණ අංශය හැකි සෑම විටම වලංගු කිරීම් සිදු කරයි. | තොරතුරු තාක්ෂණ අංශයේ හෝ මුදල් අංශයේ තොරතුරු තාක්ෂණ දත්ත නිස්සාරණයේදී බැංකුව දත්ත වලංගුකරණ පාලන කොටසක් හඳුන්වා දිය යුතු අතර එය අදාළ නිලධාරියා විසින් තහවුරු කළ යුතුය. |

**3.3 ස්ථාවර වත්කම් ලේඛනය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනයේ පහත තොරතුරු ඇතුළත් නොවේ.<br>- ඉන්වෙන්ටරි අංක<br>- වත්කම් විකිණුම්කරු<br>- බැහැර කළ වත්කම් ලැයිස්තුව<br>- වත්කම් පවතින ස්ථානය | ස්ථාවර වත්කම් ලේඛනයේ ඉන්වෙන්ටරි අංකය දැන් යාවත්කාලීන කර ඇත. බැහැර කිරීමේ වත්කම්වල වෙනම ලැයිස්තුවක් මූල්‍ය ප්‍රකාශන සමඟ සපයනු ලැබේ. | ඉන්වෙන්ටරි අංක, වත්කම් විකිණුම්කරු, බැහැර කළ වත්කම් ලැයිස්තුව සහ වත්කම් පවතින ස්ථානය පිළිබඳ විස්තර ස්ථාවර වත්කම් ලේඛනයේ පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් සත්‍යාපනයේ සැසඳුම් වාර්තාව සහ ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් සත්‍යාපන වාර්තාව සමඟ ලබා දෙනු ඇත. | 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් සත්‍යාපනයේ සැසඳුම් වාර්තාව සහ ස්ථාවර වත්කම් ලේඛනය බැංකුවේ ගිණුම් සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 3.4 බැංකුවේ තොරතුරු පද්ධතිය

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ණය සහන (moratorium) අත්හිටුවීම සඳහා පද්ධති වෙනස් කිරීමේ ඉල්ලීමක් කර තිබුණද බැංකුව වෙනස් කිරීමේ ඉල්ලීම් පෝරමය නඩත්තු කර නොතිබුණි. තවද 2020 දී යූඒටී පරීක්ෂණය සඳහා උපකාරක සාක්ෂි කිසිවක් නොතිබුණි. | බැංකුවේ පරීක්ෂණ සඳහා යාන්ත්‍රණයක් තිබුණද, ලේඛන ක්‍රියාවලිය ආරම්භ කළේ 2021 ඔක්තෝම්බර් මාසයේදී පමණි. | බැංකුව වෙනස් කිරීමේ ඉල්ලීම් පෝරමය සහ යූඒටී පරීක්ෂණ පෝරමය පවත්වා ගත යුතු අතර එය නිසි ලෙස ලේඛනගත කළ යුතුය. |
| (ii) | බැංකුව 2020 වර්ෂය සඳහා භෞතිකව හෝ පද්ධතිය තුළම වෙනස්වීම් ලොග් පවත්වා ගෙන නොතිබුණි. | මූලික බැංකුකරණ විසඳුම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමාත්‍ය ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර නොමැත.<br>2021-අප්‍රේල්-23 දිනැති CBSL ලිපිය (සැක: 02/19/306/0001/006) මගින්, SMIB යෝජිත ඒකාබද්ධ කිරීම හේතුවෙන් මූලික බැංකුකරණ විසඳුම මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන වියදම් වියදම් නොකිරීමට සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දී ඇත. මණ්ඩලයේ උපදෙස් අනුව ආධාරක මූලික බැංකුකරණ විසඳුමක් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව මූලික CBS එකක් ලබා ගැනීම සඳහා අලුත් ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. | බැංකුව භෞතිකව හෝ පද්ධතියේ වෙනස්වීම් සටහන් ලේඛණයක් පවත්වා ගත යුතුය. |
| (iii) | ඒඑස් 400 සඳහා පරිශීලක ප්‍රවේශ නොතිබුණි. | ඉදිරිපත් කරනු ඇත. | බැංකුව ඒඑස් 400 සඳහා පරිශීලක ප්‍රවේශ සංවර්ධනය කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමණාකරනය

**විගණන නිරීක්ෂණ**

මූලික බැංකු විසඳුම (core banking solution) මිලදී ගැනීමේ ක්‍රියාවලිය 2016 ජූනි මස ආරම්භ වුවද, විගණන දිනය දක්වා නව මූලික බැංකු විසඳුම මිලදී ගැනීමට බැංකුවට නොහැකි වී තිබුණි.

**කළමනාකරණ අදහස්**

මූලික බැංකු විසඳුම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමාත්‍ය ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර නොමැත.

2021-අප්‍රේල්-23 දිනැති CBSL ලිපිය (සැක: 02/19/306/0001/006) මගින්, SMIB යෝජිත ඒකාබද්ධ කිරීම හේතුවෙන් මූලික බැංකු විසඳුම මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන වියදම් වියදම් නොකිරීමට සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දී ඇත. මණ්ඩලයේ උපදෙස් අනුව ආධාරක මූලික බැංකුකරණ විසඳුමක් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව මූලික CBS එකක් ලබා ගැනීම සඳහා අලුත් ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කර ඇත.

**නිර්දේශය**

බැංකුව සඳහා මූලික බැංකු විසඳුම හැකි ඉක්මනින් මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

**විගණන නිරීක්ෂණ**

බැංකුවේ සේවක සංඛ්‍යාව අනුව, අනුමත සේවක සංඛ්‍යාව සහ සත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙළින් 467 සහ 369 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2020.12.31 දිනට පුරප්පාඩු 98 ක් තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් ප්‍රධාන කළමනාකාර තනතුරු පුරප්පාඩු වී ඇති බවත් එය බැංකුවේ සුමට ක්‍රියාකාරිත්වයට බලපාන බවත් වැඩිදුරටත් අනාවරණය විය.

| කාර්ය විස්තරය | අනුමත තනතුරු | පුරවන ලද තනතුරු | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | 1 | 1 | 0 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) | 3 | 1 | 0 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා සැලසුම්) | | 0 | 2 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | | 0 | |

**කළමනාකරණ අදහස්**

බැංකුවේ සේවක සංඛ්‍යාව බැංකුවේ යෝජිත ශාඛා පුළුල් කිරීමට අනුකූලව මුලින් නිර්මාණය කර ඇත. කෙසේ වෙතත්, බැංකුවේ අවම නියාමන ප්‍රාග්ධනය රැස්වන තුරු නව ශාඛා විවෘත කිරීමට අවසර දීම **CBSl** විසින් අත්හිටුවා ඇති අතර, පුරප්පාඩු පිරවීම කල් දමා ඇත.

**නිර්දේශය**

බැංකුවේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

| | | | |
|---|---|---|---|
| (මානව සම්පත් සංවර්ධන සහ කළමනාකරණය) | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (ණය) | | 0 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (නීති) | | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) | | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (අයකරගැනීම්) | | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (HR & L) | 10 | 1 | 5 |
| සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණය) | | 0 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා මෙහෙයුම්) | | 0 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (තක්සේරු) | | 0 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (ණය-බෙදාහැරීම සහ අධීක්ෂණ) | | 0 | |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| ප්‍රධාන කළමනාකරු (ණය) | | 2 | |
| ප්‍රධාන කළමනාකරු (ශාඛා මෙහෙයුම්) | | 1 | |
| ප්‍රධාන කළමනාකරු (HR&L) | 12 | 1 | 5 |
| ප්‍රධාන කළමනාකරු (අවදානම් කළමනාකරණය) | | 1 | |
| ප්‍රධාන කළමනාකරු (නීති) | | 0 | |

<table>
<tr><td>ප්‍රධාන කළමනාකරු (අනුකූලත්වය)</td><td rowspan="4"></td><td>1</td><td rowspan="4"></td></tr>
<tr><td>ප්‍රධාන කළමනාකරු (තක්සේරු)</td><td>1</td></tr>
<tr><td>ප්‍රධාන කළමනාකරු (තොරතුරු තාක්ෂණ)</td><td>0</td></tr>
<tr><td>ප්‍රධාන කළමනාකරු (අයකරගැනීම්)</td><td>0</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී</td><td>2</td><td>0</td><td>2</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අලෙවිකරණය</td><td>1</td><td>0</td><td>1</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ ශාඛා කළමනාකරු</td><td rowspan="2">24</td><td>10</td><td rowspan="2">1</td></tr>
<tr><td>ශාඛා කළමනාකරු</td><td>13</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ කළමනාකරු - තක්සේරු</td><td rowspan="3">12</td><td>3</td><td rowspan="3">0</td></tr>
<tr><td>කළමනාකරු - තක්සේරු</td><td>2</td></tr>
<tr><td>සහකාර කළමනාකරු - තක්සෙරු</td><td>7</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ කළමනාකරු- නීති</td><td rowspan="3">18</td><td>0</td><td rowspan="3">2</td></tr>
<tr><td>කළමනාකරු-නීති</td><td>5</td></tr>
<tr><td>සහකාර කළමනාකරු - නීති</td><td>11</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ කළමනාකරු - තොරතුරු තාක්ෂණ</td><td rowspan="3">4</td><td>1</td><td rowspan="3">3</td></tr>
<tr><td>කළමනාකරු - තොරතුරු තාක්ෂණ</td><td>0</td></tr>
<tr><td>සහකාර කළමනාකරු - තොරතුරු තාක්ෂණ</td><td>0</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය</td><td rowspan="3">35</td><td>2</td><td rowspan="3">5</td></tr>
<tr><td>කළමනාකරු - ණය</td><td>4</td></tr>
<tr><td>සහකාර කළමනාකරු - ණය</td><td>24</td></tr>
<tr><td>මානව සම්පත් කළමනාකරු</td><td rowspan="2">1</td><td rowspan="2">0</td><td rowspan="2">1</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ කළමනාකරු - HRD</td></tr>
</table>